Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

ශිෂ්‍යයාගේ නම :- ....................................................................................................................

## I කොටස

❖ **පළමු කොටසෙහි අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

- **අංක (01) සිට (03) තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.**

01. ''මඩොල් දූව'' භාෂා රාශියකට ...................................... වූ රසවත් නවකතාවකි.
    (i) පරිවර්තනය (ii) පරිවර්ථනය
    (iii) පරිවර්තණය (iv) පරිවර්ථණය

02. ලංකාවේ ....................................... වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය.
    (i) විෂිෂ්ටතම (ii) විශිෂ්ඨතම
    (iii) විශිෂ්ටතම (iv) විශිස්ටතම

03. බෝධිසත්වයෝ මෙසේ ........................................... කොට ගත්හ.
    (i) අධිෂ්ඨාන (ii) අධිශ්ඨාන
    (iii) අධිස්ඨාන (iv) අධිෂ්ටාන

- **අංක (04) සිට (05) තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදවලට ගැළපෙන ඉඟි වැකි තෝරා යටින් ඉරක් අඳින්න.**

04. උපාසිකාව <u>උදෑසනින් ම</u> පන්සල් ගියා ය.
    (i) නා කපන වැස්ස (ii) ගිනි ගහන අව්ව
    (iii) හොරගල් අහුලමින් (iv) කුකුළා අතින් ගෙන

05. නිමල් ගෙදර යන විට <u>තද වැසි</u> ඇති විය.
    (i) ගොළුබෙලි ගමනින් (ii) ගිනි ගහන අව්ව
    (iii) නා කපන වැස්ස (iv) ආ පයින් ම

- **අංක (06) සිට (08) දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට සමානාර්ථය දෙන වචනය තෝරන්න.**

06. පිවිතුරු
    (i) ප්‍රසිද්ධ (ii) පවිත්‍ර (iii) පියකරු (iv) අලංකාර

07. ජලය
    (i) උදුල (ii) උදක (iii) උභය (iv) උවිඳු

08. ධවල
    (i) සුදු (ii) කළු (iii) රන්වන් (iv) රිදී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක (09) සිට (11) දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වචනවලට විරුද්ධාර්ථය දෙන වචනය තෝරන්න.**

09. විදේශික
(i) ආදේශක (ii) ආයෝජන (iii) ස්වදේශික (iv) දේශික

10. සතුට
(i) ප්‍රීතිය (ii) සොම්නස (iii) නන්දනය (iv) දොම්නස

11. පුළුල්
(i) පළල් (ii) පටු (iii) අවුල් (iv) පවිටු

- **අංක (12) සිට (14) දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුරු තෝරන්න.**

12. අපි බැති ගී පුහුණු ..............................................
(i) උනෙමු. (ii) උනෙමි (iii) විය (iv) වූයේ ය.

13. ගොවියෝ කල් යල් බලා කුඹුරු ..............................................
(i) වපුරයි. (ii) වැපිරුවේ ය. (iii) වපුරති. (iv) වපුරන්නේ ය.

14. .............................................. පාරේ වැඩ නිම කළහ.
(i) කම්කරුවෝ (ii) කම්කරුවා (iii) කම්කරුවන් (iv) කම්කරු

15. පහත දී ඇති පද අතරින් උක්ත නාම පදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(i) දරුවන් (ii) අප (iii) ඔවුන් (iv) ළමයි

16. පහත සඳහන් පද අතරින් අනුක්ත නාම පදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(i) මිනිසුන් (ii) අපි (iii) මම (iv) ගොවියෝ

17. ''කෞට්ලයා'' යන්නෙහි නිවැරදි පිල්ලම් යෙදෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
(i) ගයනුකිත්ත, කොම්බුව, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(ii) කොම්බුව, ගයනුකිත්ත, ඉස්පිල්ල, යංශය, ඇලපිල්ල
(iii) කොම්බුව, යංශය, ඇලපිල්ල, ගයනුකිත්ත, ඉස්පිල්ල
(iv) ගයනුකිත්ත, ඉස්පිල්ල, කොම්බුව, යංශය, ඇලපිල්ල

- **පහත වාක්‍යයන්හි ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.**

18. සැන්දෑවේ .............................................. (මල / මළ) හිරුගේ රැස් දහරින් හද .............................................. (මළ / මල) විකසිත විය.

19. පහළ ලන්දේ .............................................. (තන / තණ) කමින් සිටින එළදෙනගේ .............................................. (තණ / තන) බුරුල්ලෙන් පැටවා කිරි උරා බොයි.

20. .............................................. (වණය / වනය) තුළ අතරමං වූ ඇතින්න පාදයේ .............................................. (වනය / වණය) නිසා ඉමහත් පීඩා වින්දා ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- ❖ **අංක 01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ.**
- ❖ **අංක 3, 4, 5, 6, 7 යන ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

---

01. දෙවන වාරයේ දී ඔබ විසින් උගත් ජනකවි පාඩම ඇසුරෙන් සිදු කරන ලද ක්‍රියාකාරකම අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) පෙළ පොතේ ජනකවි ගැන කියවෙන පාඩමේ නම කුමක් ද? **(ලකුණු 01)**

(ii) ජන කවිය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. **(ලකුණු 02)**

(iii) ඔබ උගත් ජනකවි වර්ග තුනක් ලියන්න. **(ලකුණු 03)**

(iv) ජන කවිය බිහි වීමට බලපෑ හේතු තුනක් ලියන්න. **(ලකුණු 03)**

(v) පෙළ පොතේ ජනකවි පාඩමේ ඇතුළත් එක් ජන කවියක් ලියන්න. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 12)**

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නොඅඩු රචනයක් ලියන්න.

1. තුරු ලතා රැක ගනිමු.
2. වචන්නෝ දිනන්නෝ ය.
3. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය
4. උගත මනා ශිල්පයමයි - මතු රැකෙනා
5. උදෑසන අසිරිය **(ලකුණු 16)**

03. 20 වෙනි උපන් දිනය සමරන වැඩිමහල් සොයුරියට යවන උපන්දින සුබ පැතුම් පතක් සකසන්න.

**(ලකුණු 12)**

04. පිපී ගියා වූ ගන මූකලන් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙතී
..........................................................................
..........................................................................

(i) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. **(ලකුණු 04)**

(ii) මෙම පද්‍ය පන්තියෙන් කියවෙන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද? **(ලකුණු 02)**

(iii) එම කාලය තුළ සිදුවන දේවල දෙකක් ලියන්න. **(ලකුණු 02)**

(iv) ''මූකලාන'' සහ ''පාට'' යන පදවලට සමාන පදය බැගින් ලියන්න. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කියන ලද්දේ දැයි ලියා දක්වන්න.

(i) ''ඈ අප්පේ, කාට දැකුමක් ද ඔය කඩේ ගෙනියන්නේ?''

(ii) ''සුරුට්ටු ද බොන්නේ, බුලත්ම ද කන්නේ''

(iii) ''එසේය පැනුත් බොම්හ. තොප වසඟයටත් නොපැමිණෙම් හ.''

(iv) ''ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ''

(v) ''කුමරුවනි, කිසි විටෙක බිය නොවව.'' **(ලකුණු 10)**

06. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බැද්ද පුරා සුදු රෙද්ද වගෙයි අද
ඉද්ද පනා මල් කැන් පිපිලා
සද්ද මොකෝ අවුරුද්ද ඇවිල්ලද
නැද්ද කනෙයියනි රොන් සැදිලා

පේර දිවුල් පලු වීර ඉදී එන
වාරෙ වගෙයි මේ පැණි පිරිලා
බැද්දට මල් වරුසාවක් වැහැලද
ගස්වල ගෙඩි පැණි වැස්සට තෙමිලද

(i) මල් පිපී ඇත්තේ කෙසේ ද?

(ii) සද්දෙ ඇති වී තිබෙන්නේ මක් නිසාද?

(iii) මෙහි ඇතුළත් පලතුරු වර්ග මොනවාද?

(iv) මල් වැස්ස නිසා කුමක් වී තිබේද?

(v) සමාන පද කවියෙන් තෝරා ලියන්න.

වනය - ශබ්දය - **(ලකුණු 10)**

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගවයා යනු ශ්‍රී ලාංකික කෘෂි කර්මාන්තයට නැතිව ම බැරි සත්ත්වයෙකි. තාක්ෂණික ලෝකයේ දියුණුවක් ඇති වන්නට පෙර කෘෂි ජීවිතයට සම්බන්ධ ව බොහොමයක් අවශ්‍යතා පූර්ණ කර ගැනීමට ගවයාගෙන් ලැබුණේ නොමද සහයකි. විශේෂයෙන් වී ගොවිතැනට අවශ්‍ය වූ සහයෝගයට අමතර ව ජනතාව පෝෂණය කිරීමේදී කිරි ලබා දීමත් ශාක පෝෂණය උදෙසා ගොම පොහොර ලබා දීමත් ප්‍රවාහන කටයුතු ඇතුළු බර ඉසිලීමේ කර්තව්‍යයක් ගවයාගෙන් හා කිරි එළදෙනගෙන් ඉටු වුණි. ගොම මැටි සමඟ කලවම් කර ගෙමිදුලෙහි ආලේප කිරීමෙන් අපේක්ෂා කරන ලද්දේ පවිත්‍රතාවයයි.

මනුෂ්‍ය ජීවිතයට අවශ්‍ය වන්නා වූ අවශ්‍යතා රැසක් සම්පූර්ණ කර දීමේ යෙදෙන්නා වූ ගවයා දේවත්වයට පත් කිරීමට පවා හින්දු සමාජය කටයුතු කර ඇත්තේ එකී සත්ත්වයා කෙරෙහි දක්වන්නා වූ අනුපමේය උපහාරය හේතුවෙනි.

(i) හින්දු සමාජය ගවයාට කළ උපහාරය කුමක් ද?

(ii) ඡේදයෙන් කියැවෙන අන්දමට පවිත්‍රතාවය ලබා ගන්නේ කෙසේ ද?

(iii) කිරි හා ගොම පොහොර මගින් මිනිසාට ලැබුණු ප්‍රයෝජන මොනවා ද?

(iv) කෘෂි ජීවිතයට සම්බන්ධ බොහොමයක් අවශ්‍යතා ගවයා අපට ලබා දුන්නේ කුමන කාලයකදී ද?

(v) ගවයාගෙන් ඉටු වූ කාර්යයන් තුනක් ලියන්න. **(ලකුණු 12)**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | (i) | 02. | (iii) |
| 03. | (i) | 04. | (iv) |
| 05. | (ii) | 06. | (ii) |
| 07. | (ii) | 08. | (i) |
| 09. | (iii) | 10. | (iv) |
| 11. | (ii) | 12. | (i) |
| 13. | (iii) | 14. | (i) |
| 15. | (iv) | 16. | (i) |
| 17. | (ii) | 18. | මළ / මල |
| 19. | තණ / තන | 20. | වනය / වණය |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

01. (i) සසඳ සසඳ අපි හඳ පානේ යනවා (ලකුණු 01)

(ii) පොත පතෙහි දැනුමක් නොමැති පොදු ජනයා එදිනෙදා ජීවිතය ඇසුරෙන් ලද අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණය කරන ලද කවි ජනකවි නම් වේ. (ලකුණු 02)

(iii) ගොයම් කවි, පතල් කවි, පාරු කවි (ලකුණු 03)

(iv) * විවේකය ගත කිරීම සඳහා
* වෙහෙස මහන්සිය නිවා ගැනීම සඳහා
* විනෝදාස්වාදය සඳහා
* පාළුව නැති කර ගැනීම සඳහා (ලකුණු 03)

(v) පෙළ පොතේ ජනකවි පාඩමේ අදාළ ඕනෑම ජනකවියක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 12)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02. මාතෘකාවට අනුව පෙළ ගස්වා ඇති රචනයට අදාල ලකුණු ලබා දෙන්න. (ලකුණු 16)

03. අදාල කරුණු සඳහන් සුභ පැතුම් පතක් සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 12)

04. (i) නෙළුම් කුමාරිට කියන්නවුන් වගේ
විලේ පියාඹත් බමරෝ රුං රුං ගගා (ලකුණු 04)
(ii) උදෑසන කාලය පිළිබඳව (ලකුණු 02)
(iii) 1. හිරු නැගීම 2. මල් පිපීම (ලකුණු 02)
(iv) මූකලාන - වනය / කැලය
පාට - වර්ණය (ලකුණු 02)
(මුළු ලකුණු 10)

05. (i) නරියා විසින් ඉසබා ඔසවාගෙන ගිය මාන කොක්කුන්ට
(ii) නරියා විසින් ගමරාලට
(iii) බෝධිසත්ව වඳුරා විසින් රාක්ෂයාට
(iv) මුවන්තිස්ස කුමරා විසින් සහෝදරයන්ට
(v) දඬුවම් ලැබූ මහ ඇමතිහුගේ කථා වස්තුවෙහි කපටි ස්ත්‍රිය විසින් මංමුළා වූ කුමරුන්ට
(ලකුණු 10)

06. (i) සුදු රෙද්ද වගේ
(ii) අවුරුද්ද ඇවිල්ලා
(iii) පේර, දිවුල් , පලු , වීර
(iv) ගස්වල ගෙඩි පැණි වැස්සට තෙමිලා
(v) වනය - බැද්ද
ශබ්දය - සද්දෙ (ලකුණු 10)

07. (i) ගවයාට දේවත්වයෙන් සැලකීම.
(ii) ගොම මැටි සමඟ කලවම් කර ගෙමිදුලෙහි ආලේප කිරීම මගින්
(iii) ජනතාව පෝෂණය කිරීම හා ශාක පෝෂණය
(iv) ලෝකයේ තාක්ෂණික දියුණුවට පෙර යුගයේ දී
(v) 1. ප්‍රවාහන කටයුතු ඇතුළුව බර ඉසිලීම.
2. කෘෂි කර්මාන්තයට සහාය වීම.
3. ජනතාව හා ශාක පෝෂණය (ලකුණු 12)

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...



Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..